# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# උතුරු පළාත
# අවසාන වාර පරීක්ෂණය 2013
# සිංහල භාෂාව හා සාහිත්‍යය
# 1කොටස

විභාග අංකය :……………..

**11 ශ්‍රේණිය** **කාලය පැය 1**

**විභාග අංකය** **මුළු ලකුණු**

---

**<u>සැළකිය යුතුයි</u>**

**සියළුම ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න**

**අංක 1 සිට 40 තෙක් ප්‍රශ්ණ වලදී (1) (2) (3) (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**

**අංක 1 සිට 4 තෙක් ප්‍රශ්ණ වල තදකළ අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

1 කජු ඉඩමට යාව ඇති බිම් කොටස හිමිකරගැනීමට සභාපතිවරයා **<u>කැසකවයි.</u>**

1 තරඟකරයි 2 උගුල් අටවයි 3 රණ්ඩුකරයි 4 උත්සහකරයි

2 පවිටු මිතුරන් ඇසුරු නොකරන්නැයි පියා පුතුට දුන් අවවාද **<u>වක්කඩේ හකුරු හැංගුවා</u>** වැනිය.

1 පුතා අකීකරු වීම 2 නිෂ්ඵලය ක්‍රියාවක් වීම

3 හකුරු දියවීයාම 4 මිත්‍ර ආශ්‍රයෙන් වැළකීම

3 කුමන කුරුළු රජදහන තුළ ගමන් කරද්දී **<u>තොර තෝංචියක් නැතිව</u>** ඇසෙන කුරුල්ලන්ගේ මිහිරි නාදයෙන් අපේ සිත් සතන් පිනා ගියේය.

1 ඉදහිට 2 නිතරම 3 අතුරු සිදුරු නැතිව 4 නොකඩවා

4 තරග විභාග කොතරම් පැවැත්වුවත් බොහෝ දෙනා **<u>පස්සා දොරින්</u>** රැකියා ලබා ගන්නා බව කවුරුත් දනිති.

1 අප්‍රසිද්ධියේ 2 අනියම් මගින් 3 නියමිත ක්‍රමයෙන් 4 පමා වී

**අංක 5 සිට 7 තෙක් ඇති ප්‍රශ්ණ වල හිස්තැන් වලට වඩාත් සුදුසු පදය තොරන්න.**

5 උසස් පතපොත ……………කිරීමෙන් පාඨකයාගේ රුචිකත්වය වැඩිදියුණුකළ හැකිය.

1 පරිකල්පනය 2 පරිශීලනය 3 පරිභොජනය 4 පරිහරණය

6 අපේ දේශයටම..................කලා සම්ප්‍රදායන් පැරණි විහාර බිතුසිතුවම් වල නිරූපනය වන බව විචාරකයෝ පවසති.

1 ආරෝපිත 2 අනිවාර්ය 3 කල්පිත 4 ආවේණික

7 ඉංජිනේරු ශිල්පියෙකුට ශාස්ත්‍රීය දැනුම පමණක් නොව................ අත්දැකීම් ද තිබිය යුතුයි

1 ස්ථානගත 2 ප්‍රායොගික 3 බුද්ධිමත් 4 නවීන

8 අකාරාදි පිළිවෙලට නම් යෙදී ඇති වරණය තෝරන්න

1 උත්පලා එරන්දතී වාසනා සමන්ති

2 නයනී අනුරාධිකා පබෝධා සෙව්වන්දි

3 හසනී නයනා දමිතා ලලන්ති

4 අනුපමා ඉරෝෂණී කෝකිලා ආලෝකි

9 අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න

1 සමස්ථ පුස්ථකාලය ප්‍රශස්ත ප්‍රස්තාවනාව

2 විශිෂ්ඨ ශිෂ්ඨාචාරය කනිෂ්ඨ ජ්‍යෙෂ්ඨ

3 ප්‍රශ්ණ උෂ්ණ කළණ තිළිණ

4 ප්‍රතිපත්තිය පාංශුබාදනය සංරක්ෂණය අධිෂ්ඨානය

10 පහත දැක්වෙන පද පේළි අතුරින් යුගල පදයක් නොවන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න

1 අකාමකා අතනමෙතන අතුරුසිදුරු අඩුපාඩු

2 කල්යල් කල්පනා කයිකතන්දර කඩිමුඩි

3 තදබද තක්කුමුක්කු තරම තිරම තාන්න මාන්න

4 ඉගිබිගි ඉඩම්කඩම් ඉඳුම්හිටුම් ඉවුම්පිහුම්

11 එක් එක් පේළියේ මුලින් දැක්වෙන පදයේ අර්ථයට විරුද්ධාර්ථයක් දෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.

1 සිරස- මුදුන මස්තකය ශිර්ෂය හිස

2 ප්‍රවීන - ප්‍රතිවීන ප්‍රාචීන අවිනීත සුවිනීත

3 කෘතිම - තාක්ෂණික සවංක්‍රීය නවීන ප්‍රසාදජනක

4 නේවාසික- ගෘහාශ්‍රිත ආගන්තුක අනේවාසික අනුග්‍රාහක

12 මුලින් දී ඇති පදයට සමානාර්ථ දෙන පද හතරම ඇතුළත් පේළිය තෝරන්න

1 නද - නදිය, සතුට, නාදය, නාමය

2 දළ - දළය, දැඩි, දළදාව, දත්

3 ඇස් - ඇස, සිදුර, හය, දැල

4 පාද - පර්වතය, පාදය, සලම,ගස්මුල

13 මුලින් දී ඇති පදය නිවැරදිව සන්ධි කර ඇති වරණය තෝරන්න

1 වක්+කඩ = වක්කඩ 2 දෙ+අත් = දෙත්

3 අඩු+කම් = අඩුකම් 4 ඔවුන්+ඔවුන් =ඔවුනොවන්

**අංක 14 සිට 15 තෙක් ප්‍රශ්ණවල තද කළු අකුරින් මුද්‍රිත කොටස් වෙනුවට යෙදිය හැකි වඩාත්ම ගැළපෙන තනිපදය තෝරන්න.**

14 **තමාගේ අභිමතය පරිදි ක්‍රියාකරන්නෙකු** නායකත්වයට නුසුදුසු බව සභාවේ සිටි සියළු අය තීරණය කළහ

1 ආත්මාර්ථකාමියකු 2 පරහිතකාමියකු

3 අත්තනෝමතිකයකු 4 හිතුවක්කාරයකු

15 **කළගුණ දන්නා අයට** ගෞරව කිරීම අප කාගේත් යුතුකමකි

1 කෘතහස්ත අයට 2 කෘතවේදී අයට

3 ගුණමකු අයට 4 සුදනන්ට

**අංක 16 සිට 19 තෙක් වාක්‍ය වල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ වර්ගයකට අයත්දැයි තෝරන්න**

16 සැහැසි අංගුලිමාල **තිලෝගුරුන්** අභියස දමනය විය

1 විභක්ත සමාසය 2 විශේෂණ සමාසයක්

3 දකාරාර්ථ සමාසය 4 අන්‍යාර්ථ සමාසයක්

17 **බුද්ධිමතකු වූ** ඔහුගේ කථාව හරවත් එකක් විය

1 කෘදන්ත පදයකි 2 තද්ධිත පදයකි

3 යුගල පදයකි 4 විශේෂණ පදයකි

18 උපනන්ද නොඉවසිල්ලෙන් කාමරයේ **ඔබමොබ** සක්මන් කරන්නට විය

1 සමාසකි 2 යුගල පදයකි

3 නිපාතයකි 4 විශේෂණයකි

19 සමනළ කන්ද **හෙවත්** ශ්‍රී පාද කන්ද නැගීම දුෂ්කර වුවද විනෝද ජනකය

1 තද්ධිත 2 කෘදන්ත
3 නිපාත 4 උපසර්ග

අංක 20 සිට 22 තෙක් ඇති එක් එක් ප්‍රකාශයේ අදහසට වඩාත් සුදුසු ප්‍රස්ථාව පිරුළ තෝරන්න.

20 තමන්ගේ ආශ්‍රිතයන්ට බොහෝ උදව්පදව් කිරීමට ඉදිරිපත්වන පරාර්ථකාමීන්ට එම උදව්පදව් ලබා ගන්නා ගුණමකු පුද්ගලයන් විසින්ම අලාභහානි සිදුකිරීම

1 අත දීලා දත තියවීම 2 අතිරසත් තිත්තවීම වගෙයි

3 අගේ ඉදන් කන කැම වගෙයි 4 එකම මල්ලේ ලුණුකැම වගෙයි

21 නිසියම් දෙයක යථා තත්වය නොදැන විවිධ අදහස් පළ කිරීම

1 අන්ධයින් අලියාගේ හැඩරුව කීවා වාගෙයි

2 ඉඟුරු දී මිරිස් ගත්තා වාගෙයි

3 අඹ කෑ මිනිහාගේ නහය දනවා වාගෙයි

4 දැලි පිහිටයන් කිරි කන්නා වාගෙයි

22 මිනැවට එපාවට යම් වැඩක නිරත වීම

1 ගමරාල දිව්‍යලෝකේ ගියා වගෙයි

2 පිදුරු ගොඩේ ලැග්ග බල්ලා වාගෙයි

3 ලෙඩ කපුටා වැල ගිලින්නා වාගෙයි

4 කළුවා මාරපත් ගියා වාගෙයි

23 ශ, ෂ, ස යන අකුරු තුන නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න

1 සංශ්ලේශණය නිශ්පාදනය විකාශන විචක්ෂණ

2 නිෂ්පාදන ශීඝ්‍රගාමි කුසලතා කොට්ඨාස

3 ආශ්වාදය ආභාෂය විශ්වාස අභිලාශය

4 සමීක්ෂණය නිරීක්ශනය ප්‍රකාශණය ප්‍රෂ්ණය

**24** ඇලපිල්ල, රකාරාංශය, පාපිල්ල, ගයනුකිත්ත, යන පිල්ලම් පිළිවෙලින් යෙදුණු පද පේළිය දැක්වෙන පිළිතුර තෝරන්න.

1 කාර්යාලය අනුවාදය ඖෂධ රාත්‍රිය

2 සංලාපය ක්‍රමය පුවරුව ඖචිත්‍යය

3 පර්යේෂන කෞතුක සාංකාව සංසිද්ධිය

4 විස්තෘත අනුක්‍රමනය මූලාශ්‍ර පෞරාණික

25 **"බලයි"** යන ක්‍රියා පදයේ කර්මකාරක අතීත කාල ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියාපදය වනුයේ

1 බැලිණි 2 බැලුණා 3 බැලුවෝය 4 බැලූහ

**අංක 26 සිට 30 තෙක් දී ඇති වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍යය තෝරන්න**

26 1 රිය අනතුරින් තුවාල ලැබුවන් රෝහල් ගත කරණු ලැබූහ

2 අප සියල්ලන්ම අනාගත නායකයන් වෙතැයි අප මැණියෝ සිතති

3 දෙමාපියන් කැටුව අයියත් මමත් චාරිකාවක ගියෙමු

4 විභාගයෙන් සමත් වූවන් අතර වැඩි දෙනෙකු පාසල් අයදුම්කරුවන්ය

27 1 කලාකාමි තරුණයෝ විසින් රඟහල ඉදිකළහ

2 සභාතොමෝ සතුටින් විසිර ගියාය

3 අයෙක් නටද්දී ඇනැමෙක් ගී ගයයි

4 අසල්වාසීන් මහ රෑ පැමිණ සොරුන් අල්ලා ගත්හ

28 1 අනුශාසනය පවත්වන ලද්දේ නායක හිමියෝය

2 අයෙක් පාසලට පැමිණ ආපසු ගියේය

3 වඳුරන් ගස් සියල්ලේම ගෙඩි කඩා කැහ

4 මවුපියන් පැමිණෙති යි ඔහුවු නොසිතූහ

29 1 උතුරු පළාතේ පැවති සුළිසුළඟින් ගෙවල් විනාශ වූහ

2 මම හෝ මල්ලි හෙට ගමට යති

3 මුව රැළ වනය පුරා ඇවිදිමින් ප්‍රීති වෙයි

4 ඇමතිවරු උදෑසනම අගමැති බැහැ දුටහ

30 1 නාට්‍ය බැලීමට ප්‍රේක්ෂකයෝ පැමිණ නැත

2 තාත්තා විසින් මට පොත් විශාල සංඛ්‍යාවක් දුන්නෙහිය

3 ධීවරයන් නිපදවන ි වලින් අතර මැදියෝ ලාබ ලබති

4 හවසට වැසි වසින නිසා අපි ක්‍රීඩාවලට යාම නැවැත්වූහ

31 සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න

1 සංස්කෘතිය  පද්ධතිය සම්බන්ද ප්‍රබන්ධය

2 මනුෂ්‍ය රශාස්වාදණය වස්ත්‍රාභරණ විශේෂ

3 යන්ත්‍රය දර්ශනය ශෛලිය ආරම්භය

4 නියඟය බමුණන් මහාර්ග පුද්ගලික

අංක 32 සිට 35 තෙක් ඇති ප්‍රශ්ණවල මුලින් දී ඇති වාක්‍ය අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වාක්‍යය තෝරන්න

32 1 ඇසිපිය හෙලන පමණින් නොවෙති දෙවඟන

2 දෙවඟනන් නොවන්නේ ඇසිපිය හෙලන නිසාය

3 දෙවඟනන් ඇසිපිය නොහෙළති

4 ඇසිපිය හෙළීම දෙවඟනන්ගේ සිරිතක් නොවේ

33 කාලගෝලයා සත්අවුරුද්දක් ගෙයි කඹුට අඹුවක ලද

1 කාලගෝලයා අවුරුදු හතක් ගෙයි බැලමෙහෙ කොට අඹුවක් ලද්දේය

2 කාලගෝලයා සත්අවුරුද්දක් කුඹුරු කොටා අඹුවක ලද්දේය

3 කාලගෝලයා සත්අවුරුද්දක් අඹුවකට සාත්තු කළේය

4 කාලගෝලයා අවුරුදු හතක් මුරකර අඹුවක් ලද්දේය

34 සටනක් නැතිව සැපතක් ඇතිවිය නොහැක

1 සටන් වලින් පසු සැපත ඇති වේ

2 සැපත නිකම්ම ලැබෙන්නේ නැත

3 සැපත යනු සටනකි

4 සැපත ලබා ගැනීමට යම් ක්‍රියාවලියක යෙදිය යුතුයි

35 පොළොන්නරු යුගය වන විට සඳකඩ පහණේ රටාව මදක් වෙනස් විය

1 සඳනඩ පහන වෙනස් විය යුත්තක් නොවේ

2 සඳකඩ පහනේ රටාව මදක් වෙනස් වුයේ පොළොන්නරු යුගයේ දීය

3 පොළොන්නරු යුගය වන විට සඳකඩ පහන වෙනස් විය

4 පොළොන්නරු යුගය කලා ශිල්ප වල වෙනස්කම් ඇති කළේය

36 කිසියම් නිර්වචනයක රසය මතුකර ගැනීම සඳහා වචනයෙන් පවසන අර්ථයට වැඩියෙන් හැඟී යන අර්ථය

1 මුඛ්‍යාර්ථය 2 වාච්‍යාර්ථය

3 අතිශයෝක්තිය 4 ව්‍යංග්‍යාර්ථය

37 වැඳ මහු **පද කමල** තමා ආ තතුත කීය මුසිල

මෙහත ඉරි ඇඳි පදය

1 උපමාවකි 2 අනුප්‍රාසයකි 3 එළිසමයකි 4 රූපකයකි

38 දෙමළ ජනයා අදහන තෛයිපොංගල් උත්සවය යනු

1 අවුරුද්දේ පළමු මාසය සිහිකිරීමකි

2 කතරගම දෙවියන් උදෙසා පවත්වනු ලබන්නකි

3 හිරු දෙවියන් පිදීම සඳහා පවත්වන්නකි

4 පරණ අවුරුද්ද සැමරීමකි

39 කුරුළුපාළුව **අද්දරින්** ඉපල් අතු තීරයක් තියරවල් පිට **හිටෝනවා**

මෙහත පාඨයේ ඉරි ඇඳි පදවල අර්ථය පිළිවෙලින් ඇති පිළිතුර තෝරන්න

1 ළඟින් හිටවනවා 2 දුරින් හිටවනවා

3 මැතින් හිටවනවා 4 ළඟින් තියනවා

40 ළමයා යන පදයේ බහුවචන අනුක්ත පදය

1 ළමයි ය. 2 ළමෝ ය.

3 ළමයින් ය. 4 ළමුන් ය.